## ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය
## අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය

### 1. හැඳින්වීම

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/Trans/V/වාස්මා/2025 හා 2024.07.29 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 02/2024 අනුව අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය පහත දැක්වේ.

### 2. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර

#### 2.1 අදාල නිලධරයන්

ඒකාබද්ධ සේවයට අයත් පහත සඳහන් සේවාවන්හි නිලධරයන් සඳහා මෙම වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාල වේ.

I. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (2/3 පන්ති)
II. සංවර්ධන නිලධාරි සේවය (III / II/ I ශ්‍රේණි)
III. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය (III / II/ I ශ්‍රේණි)
IV. කළමනාකරණ සේවා නිලධාරි සේවය (III / II/ I ශ්‍රේණි)
V. රියදුරු සේවය (III / II/ I/විශේෂ ශ්‍රේණි)
VI. කාර්යාල සේවක සේවය (III / II/ I/විශේෂ ශ්‍රේණි)

#### 2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

2.2.1 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කරන ලද නිලධරයන් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අයදුම් කිරිමට සුදුසුකම් ලබයි.

2.2.2 අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය හෝ අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු විද්‍යාල යන සේවා ස්ථාන වලින් එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

#### 2.3 අභ්‍යන්තර ස්ථාන මාරු වලට අයත් වන සේවා ස්ථාන

I. අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය - අධ්‍යාපන අංශය
II. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
III. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
IV. ජාතික පාසල්
V. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
VI. ගුරු විද්‍යාල

මෙම සේවා ස්ථානයන්හි ඉහත සේවාවන්ට අදාලව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් තනතුරු අනුමත වී තිබිය යුතුය.



CamScanner

**2.4 ක්‍රමවේදය හා අනෙකුත් කරුණු**

I. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.1 ඡේදය යටතට ගැනෙන නිලධාරියෙකු මේ යටතේ ස්ථාන මාරු ඉල්ලා ඇති විටෙක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එක් සේවා ස්ථානයක හෝ සේවා ස්ථාන සමූහයක් තුළ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැකිය.

II. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතරින් වැඩි සේවා කාලයක් හෝ ඉහත 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයෙකු (අනෙකුත් කොන්දේසි වලට යටත්ව) එම සේවා ස්ථානයට මාරු කරනු ලැබේ.

III. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේදී ආයතනයේ සේවා අවශ්‍යතාවයන්ද කාර්යාල වල කාර්ය මණ්ඩල කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමටද හැමවිටම උත්සහ කරනු ලැබේ.

IV. 2025 වර්ෂය සඳහා වාර්ෂික ස්ථාන මාරු ලබා ඇති නිලධරයන් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අයදුම් <u>**නොකළ යුතුය.**</u>

V. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවන්නේ නම්, අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග අනුව කටයුතු නොකරන නිලධාරීන්ගෙන් එසේ කටයුතු නොකිරීමට හේතු විමසනු ලැබේ.

VI. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව වෙත සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත ස්ථාන මාරුවීම් ලබාදීමේ ගැටළු පැන නැගී ඇත්නම් සමාලෝචන කමිටුව මගින් එම කරුණු සලකා බලා නව ස්ථාන මාරු ලබා දීමේ හැකියාව ඇති අතර එවැනි නිලධාරින් විසින් සිදු කරන අභියාචනා නැවත සලකා බලනු නොලැබේ.

**2.4.1 සේවා කාලය ගණනය කිරීම**

I. වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කාල ගණනය කරනු ලබන්නේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනටය.(උදා :- 2025 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2024.12.31 දිනය)

II. සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරනු ලැබේ. (තවද නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ)

III. සංවර්ධන නිලධාරින් සඳහා, එක් වසරක පුහුණුව ආරම්භ කළ දිනය නොව නියමිත පුහුණුව අවසන් කිරීමෙන් පසු සංවර්ධන නිලධාරි සේවයේ තනතුරකට පත්වීම් ලබා දුන් දිනය ඔවුන්ගේ පත්වීම් දිනය ලෙස සලකා ස්ථාන මාරු අයදුම්පත් සකස් කළ යුතුය.



CamScanner

IV. අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික පාසල්, විද්‍යාපීඨ සහ ගුරු විද්‍යාල අතර අභ්‍යන්තර ස්ථාන මාරුවීම් උපරිමය වසර 10 ක් දක්වා ( ස්ථාන මාරු අවස්ථා 02 ක් යටතේ) පමණක් සිදු කරනු ලැබේ.

V. එක් ජාතික පාසලක වසර 05 ක් සේවය කර ඇති නිලධාරියෙකු නැවත ජාතික පාසලකට ඉල්ලුම් කිරීමේදී අනෙකුත් නිලධාරීන් හට අවස්ථාව ලබා දීමෙන් පසුව සලකා බලනු ලැබේ.

## 3 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පිහිටවනු ලබන ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

I. ඒකාබද්ධ සේවා අංශයේ සහකාර ලේකම්
II. වෙනත් අංශයක සහකාර ලේකම්වරයෙකු
III. ඒකාබද්ධ සේවා අංශයේ පරිපාලන නිලධාරි
IV. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායම් වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගේ අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තිය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්

## 4 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පිහිටුවනු ලබන ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

I. ඒකාබද්ධ සේවා අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
II. වෙනත් අංශයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් දෙදෙනෙකු
III. එක් එක් සේවාවට අයත් රජයේ නිලධාරීන්ගේ අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තිය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්

## 5 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ලබා දීමේදී සැළකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

### 5.1 විශේෂිත කරුණු

I. යම් නිලධරයෙකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්වයකට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයාගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.



CamScanner

II. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සහයක්ම දරණු ලැබේ.

III. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සලකා බලනු ලැබේ.

IV. ඒකාබද්ධ රියදුරු සේවයේ නියුතු නිල රථ සඳහා අනුයුක්ත කර ඇති රියදුරන් සම්බන්ධ තොරතුරු වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු රැස්වීමට පෙර දැන්විය යුතු වේ.

V. අභ්‍යන්තර ස්ථාන මාරුවීම් එක් එක් සේවාවන් සඳහා වෙන් වෙන් වශයෙන් සලකා බලනු ලැබේ.

**5.2. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් වලට යටත් නොවන නිලධාරින්**

වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා කාල ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට (උදා:- 2025 වර්ෂය සඳහා 2024.12.31 දිනට) අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි ස්ථාන මාරු නොකළ යුතුය.

**5.3 වෘත්තීය සංගම් සඳහා අනුග්‍රහය**

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පිළිගත් ඒකාබද්ධ සේවයේ සේවයකට අයත් වෘත්තීය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මාධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතු වලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කරනු ලැබේ. මෙහිදී ස්ථාන මාරුවට ලක්වන නිලධාරියා නිර්දේශය ලබා දෙන වෘත්තීය සංගමයේ මව් සංගමයේ ඉහත තනතුරු දරණ පුද්ගලයෙකු වීම අනිවාර්ය වේ. ප්‍රාදේශීය හෝ ශාඛා සංවිධාන වල නිලතල දැරීම පමණක් මෙම අනුග්‍රහය ලබා ගැනීමට සුදුසුකමක් නොවේ.

6 ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්ෂික ස්ථාන මාරු තීරණ සමඟ සම්බන්ධ කරනු ලබන අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා ක්‍රියාත්මක දිනය වන්නේ 2024 ජනවාරි මස 01 දින ය.

**7 අභ්‍යන්තර ස්ථාන මාරු කාල සටහන**

| | |
|---|---|
| 2024.10.25 | අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම |
| 2024.11.08 | අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනය |
| 2024.11.19 | අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය රැස්වීම |
| 2024.11.25 | අභ්‍යන්තර ස්ථාන මාරු තීරණ දැනුම් දීම/ අභියාචනා කැඳවීම |
| 2024.12.09 | අභියාචනා භාරගන්නා අවසාන දිනය |
| 2024.12.13 | සමාලෝචන මණ්ඩලය රැස්වීම |
| 2024.12.20 | සමාලෝචන තීරණ දැනුම් දීම |
| 2024.12.23 | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ස්ථාන මාරු තීරණ දැනුම් දීම |
| 2025 ජනවාරි 01 | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු දිනය |



CamScanner

## 8 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම

8.1 අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු මගින් ලබා දෙන තීරණ අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ වෙබ් පිටුවෙහි පළ කරනු ලබයි. එම තීරණ සම්බන්ධයෙන් අගතියට පත් වූ නිලධරයන්ට අදාල තීරණ සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන්නේ නම් ඒ සම්බන්ධයෙන් අභියාචනා යොමු කල හැක.

8.2 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 ඉහත වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණය සමාලෝචන කමිටුව විසින් ගනු ඇත්තේය.

8.4 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් වන අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අමාත්‍යාංශ වෙබ් පිටුවෙහි පළ කරනු ලබන අතර, ඒ අනුව අදාළ ලිපි ගොනු යථාවත් කර ගත යුතුය.

මැතිවරණ කොමිෂන් සභා ලේකම්ගේ අංක ES/SO/PE/2024/6-4B(i) හා 2024.10.25 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති එකඟතාව පරිදි මෙම නිවේදනය නිකුත් කරනු ලැබේ.

ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්
අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය

දිනය : 2024. 10. 25



CamScanner

අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින සේවා ස්ථාන අතර වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අයදුම්පත්‍රය - 2025

1. නිලධාරියාගේ /නිලධාරිනියගේ

I. සම්පූර්ණ නම :- ..........................................................................................................................

.........................................................................................................................මයා /මිය මෙනවිය.

II. තනතුර :- ..........................................................................

III. පදිංචි ලිපිනය සහ ආසන්නතම නගරය :-

...............................................................................................................

...........................................................................................................................................

IV. වර්තමාන සේවා ස්ථානයට පදිංචි ස්ථානයේ සිට දුර (කි.මී.) :- ..................................................................

V. උපන් දිනය :- වර්ෂය .............මාසය................. දිනය .................

VI. ජාතික හැඳුනුම්පත් අංකය :- .............................................................

VII. දුරකථන අංකය :-පෞද්ගලික ............................... රාජකාරී .................................................

VIII. විවාහක අවිවාහක බව :-..............................................................

IX. දරුවන් ගණන හා ඔවුන්ගේ වයස :- ..........................................................................................

X. පාසල් යන දරුවන් වෙතොත් ඔවුන් 2024 වර්ෂයේ ඉගෙනුම ලබන පාසල හා පන්තිය

1. ...............................................................................................................

2. ...............................................................................................................

3. ...............................................................................................................

2. නිලධාරියා / නිලධාරිනිය.

I. දැනට සේවය කරන ස්ථානය/ශාඛාව ...................................................................................

II. අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ සේවයට වාර්තා කල දිනය ........................................

III. අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් සේවා ස්ථානවල සේවය කර ඇති කාල සීමාවන්:-

| අනු අංකය | සේවා කාලය | | සේවා ස්ථානය |
|---|---|---|---|
| | සිට | දක්වා | |
| | | | |
| | | | |
| | | | |

3. අභ්‍යන්තර ස්ථාන මාරු ඉල්ලුම්කරන සේවා ස්ථාන.

| අනු අංකය | සේවා ස්ථානය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

4. අභ්‍යන්තර ස්ථාන මරු ඉල්ලීමට හේතු :-

.........................................................................................................................................

..............................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍යය බව ප්‍රකාශ කරන අතර එම තොරතුරු අසත්‍ය බව සනාථ වුවහොත් විනයානුකූලව කටයුතු කල හැකි බව මම දනිමි.

දිනය .......................... අත්සන

5. ආයතන ප්‍රධානියාගේ /ආසන්න මාණ්ඩලික නිලධාරියාගේ නිර්දේශය :-.

සුදුසු අනුප්‍රාප්තිකයෙක් සහිතව/රහිතව නිලධාරියා/නිලධාරිණිය මුදාහැරිය හැකි/නොහැකි බැවින් අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

දිනය .................................................. අත්සන සහ නිල මුද්‍රාව

CS CamScanner

**கல்வி, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சின் கீழ் இயங்குகின்ற சேவை நிலையங்களுக்கிடையிலான வருடாந்த உள்ளக இடமாற்ற விண்ணப்பப் படிவம் – 2025**

**1. அலுவலரின்**

i. முழுப்பெயர் : திரு/திருமதி/செல்வி ..............................................................................................................................................................................................

ii. பதவி :-.............................................................................................

iii. வதிவிட முகவரியும் அண்மித்துள்ள நகரமும் :-...........................................................................................................................................................................

iv. தற்போதைய சேவை நிலையத்திற்கு வதிவிடத்திலிருந்தான தூரம் (கி.மீ) :-......................

v. பிறந்த திகதி :- வருடம் ..................மாதம்..............திகதி.........................

vi. தேசிய அடையாள அட்டை இலக்கம் :-..................................................................

vii. தொலைபேசி இலக்கம் :- பிரத்தியேகம் ............................................
அலுவலகம் ............................................

viii. திருமண நிலை :-...........................................................................................

ix. பிள்ளைகளின் எண்ணிக்கையும் அவர்களின் வயதும் :-.............................................................................................................................................................................

x. பாடசாலைக்குச் செல்லும் பிள்ளைகள் இருப்பின் அவர்கள் 2024 ஆம் வருடத்தில் கல்வி கற்கும் பாடசாலையும் தரமும்.

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................

**2. அலுவலர்**

i. தற்போது கடமையாற்றும் இடம் / கிளை :-.................................................................................

ii. கல்வி, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சில் கடமைக்காக அறிக்கையிட்ட திகதி :-................

iii. அமைச்சின் கீழியங்கும் ஏனைய சேவை நிலையங்களில் சேவையாற்றியுள்ள காலம் :-

| தொ.இல | சேவைக் காலம் | | சேவை நிலையம் |
|---|---|---|---|
| | இருந்து | வரை | |
| | | | |
| | | | |
| | | | |

**3. உள்ளக இடமாற்றத்திற்காக விண்ணப்பிக்கும் சேவை நிலையம்**

| தொ.இல | சேவை நிலையம் |
|---|---|
| | |
| | |
| | |

**4. உள்ளக இடமாற்றம் கோருவதற்கான காரணம்**

.............................................................................................................................
.............................................................................................................................

மேலே தரப்பட்டுள்ள தகவல்கள் அனைத்தும் உண்மையென உறுதிப்படுத்துவதோடு இவை உண்மைக்கு புறம்பானவையென உறுதிப்படுத்தப்படும் பட்சத்தில் ஒழுக்காற்று நடவடிக்கை மேற்கொள்ள முடியும் என்பதனை நான் அறிவேன்.

திகதி.......................................  ...............................................

கையொப்பம்

5. நிறுவனத் தலைவரின் / அண்மித்த பதவிநிலை உத்தியோகத்தரின் சிபாரிசு:-

பொருத்தமான பதலீட்டாளருடன்/ பதலீட்டாளரின்றி/ அலுவலரை விடுவிக்க முடியும்/ முடியாது என விண்ணப்பத்தை சிபாரிசு செய்கின்றேன்/செய்யவில்லை.

திகதி...................................

கையொப்பமும் பதவி முத்திரையும்

CS CamScanner